00034

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

අධ්‍යාපන පීඨය

විශේෂ අවශ්‍යතා අධ්‍යාපනය පිළිබඳ අධ්‍යාපනවේදී ගෞරව උපාධි වැඩසටහන
5 වන මට්ටම-2022/2023

අවසාන පරීක්ෂණය - 2023

විශේෂිත තත්ත්වයන් සහ ඉගෙනුම් අවශ්‍යතා පිළිබඳ හැඳින්වීම - SNU5338 /ESU3138

කාලය පැය තුනයි. (03)

---

දිනය - 2023.10.22 වේලාව - ප.ව.01.30 - ප.ව.04.30 දක්වා

---

**1 වන කොටසේ සියළුම ප්‍රශ්නවලට ද, 2 වන කොටසේ ඕනෑම ප්‍රශ්න තුනකට (03) ද පිළිතුරු සපයන්න.**

## 1 වන කොටස

01. දුබලතා සහිත පුද්ගලයින්ගේ අධ්‍යාපන පනතෙහි (IDEA) නීතිය යටතේ විශේෂ අධ්‍යාපනය ලැබීමට සුදුසුකම් ලබන දරුවන්ගේ කාණ්ඩ ලැයිස්තුගත කරන්න.

02. ශ්‍රවණ ඌනතා සහිත පුද්ගලයන් සහ සම්පූර්ණයෙන් ම බිහිරි පුද්ගලයන් අතර දක්නට ලැබෙන සැලකිය යුතු වෙනස්කම් විස්තර කරන්න.

03. අතීතයේ දුබලතාවය නිසා නොවන නමුත් අධ්‍යාපනයෙන් වෙන් වූ ශිෂ්‍ය වර්ග පහක් (05) නම් කරන්න. ඉහත එක් එක් වර්ගය සඳහා උදාහරණය බැගින් ලබා දෙන්න.

04. අපස්මාරයෙහි පුළුල් ක්ෂේත්‍ර දෙක (02) සඳහන් කර ඉන් එක් ක්ෂේත්‍රයක් කෙටියෙන් පැහැදිලි කරන්න.

05. ජල කපාලතාවයෙහි පොදු රෝග ලක්ෂණ පහක් (05) සඳහන් කර, ජල කපාලතාව හටගන්නා ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න.

06. ළමයා ස්වභාවික මෝරීමේ ක්‍රියාවලිය තුල නොවැඩෙන විට ස්වර විද්‍යානුකූල අක්‍රමතාව ඇති වේ.
ස්වර විද්‍යානුකූල අක්‍රමතා පිළිබඳ දැනුවත්භාවය වැඩි දියුණු කිරීම සඳහා ගුරුවරයෙකුට පන්ති කාමරය තුළ ලබාදිය හැකි සහයන් හතරක් (04) විස්තර කරන්න.

07. අනුවර්තී චර්යා සඳහා වැදගත් වන ප්‍රධාන කුසලතා තුනක් (03) සාකච්ඡා කර ඒ සෑම කුසලතාවයක්ම කෙටියෙන් පැහැදිලි කරන්න.

08. අවධාන ඌන අධික්‍රියාකාරී අක්‍රමතාව (ADHD) සහිත දරුවන්ගේ සහ හැසිරීම් අක්‍රමතාව (CD) සහිත දරුවන්ගේ ලක්ෂණ පහක් (05) සංසන්දනය කරන්න.

(ලකුණු 05 x 08 = 40)

## 2 වන කොටස

09\. (i) බුද්ධිමය දුබලතාවෙහි හඳුනාගත හැකි මූලික සාධක දෙකක් විස්තර කරන්න. (ලකුණු 03)

(ii) බුද්ධිමය දුබලතාවය හා සම්බන්ධ සහ ගති ලක්ෂණ පහක් (05) සඳහන් කරන්න. (ලකුණු 05)

(iii) බුද්ධිමය දුබලතාව ලෙස රෝග විනිශ්චය කල සිසුන් සඳහා සාර්ථක ඉගෙනීමට පහසුකම් සැලසීම සඳහා ක්‍රියාත්මක කළ හැකි ක්‍රම පරීක්ෂා කරන්න. (ලකුණු 12)

10\. (i) කථන අක්‍රමතාව සහ භාෂා අක්‍රමතාව අතර වෙනස පැහැදිලි කරන්න. (ලකුණු 03)

(ii) කථන අක්‍රමතා වර්ග හතරක් (04) සඳහන් කර ඒවායින් දෙකක් (02) පැහැදිලි කරන්න. (ලකුණු 05)

(iii) කථන සහ භාෂා අක්‍රමතාවලට අදාළ සමාජ හා චිත්තවේගීය ගැටලු විශ්ලේෂණය කරන්න. (ලකුණු 12)

11\. (i) Gagne (1996) ට අනුව සුහග බව අභියෝග්‍යතා ක්ෂේත්‍ර එකක හෝ ඊට වඩා වැඩි ගණනක විශිෂ්ඨ හැකියාවන් ලෙස සංකල්පීකරණය කරනු ලබයි.
'සුහග' සහ 'සහජ දක්ෂතා' යන පද නිර්වචනය කරන්න. (ලකුණු 03)

(ii) සුහග සිසුන් තුළ දැකිය හැකි ගති ලක්ෂණ පහක් නම් කර ඒවායින් තුනක් (03) සුදුසු උදාහරණ සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 05)

(iii) සුහග සහ සහජ දක්ෂතා සහිත සිසුන්ට අන්තර්කරණ පන්තිකාමරයක ඉඩ සැලසිය හැකි ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 12)

12\. (i) කායික දුබලතාව යන යෙදුම ඔබේ වචනයෙන් නිර්වචනය කරන්න. (ලකුණු 03)

(ii) පොදු කායික දුබලතා වර්ග තුනක් (03) සඳහන් කර ඒවා කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(iii) ඔබ මස්තිෂ්කාඝාතය (Cerebral Palsy) සහිත සිසුන්ට අධ්‍යාපනික සහය ලබා දෙන ගුරුවරයෙකු යැයි සිතන්න.

(අ) ඉහත සිසුන් ඔවුන් ඉගෙනීමේදී මුහුණ දෙන, ඔබ විසින් නිරීක්ෂණය කල බාධක තුනක් (03) ලැයිස්තු ගත කරන්න.

(ආ) එම බාධක සඳහා සහයක තාක්ෂණය යොදා ගනිමින් ඔවුන්ට සහය වන්නේ කෙසේදැයි විස්තර කරන්න. (ලකුණු 12)

13. (i) පූර්ණ අන්ධභාවය සහ දෘෂ්ටි ඌනතාවය අතර වෙනස උදාහරණ දක්වමින් පැහැදිලි කරන්න. (ලකුණු 03)

(ii) ළමුන් අතර බහුලව දක්නට ලැබෙන දෘෂ්ටි ඌනතා වර්ග තුනක් (03) පැහැදිලි කරන්න. (ලකුණු 05)

(iii) අ) ඉගෙනුම් ඉගැන්වීමේ ක්‍රියාවලියේ දී දෘෂ්ටි ඌනතා සහිත සිසුන්ට ඉඩසැලසිය හැකි ක්‍රම පහක් (05) විස්තර කරන්න. (ලකුණු 06)

ආ) අන්තර්කරණ පන්ති කාමරයක දෘෂ්ටි ඌනතා සහිත සිසුන්ට ඉගැන්වීමේ දී ඔබ මුහුණ දෙන අභියෝග පහක් (05) නම් කර ඔබ එම අභියෝගවලට මුහුණ දෙන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 06)

14. (i) සුවිශේෂී ඉගෙනුම් දුබලතා ප්‍රධාන වර්ග තුන (03) විස්තර කරන්න. (ලකුණු 03)

(ii) "පූර්ව රෝග විනිශ්චය සහ පූර්ව මැදිහත්වීම් තුලින් ඉගෙනීමේ දුබලතා අවම කර ගත හැකිය."

ඉහත සඳහන් එක් එක් ඉගෙනුම් දුබලතා සඳහා පූර්ව අනතුරු ඇඟවීමේ සංඥා තුන (03) බැගින් සඳහන් කරන්න. (ලකුණු 05)

(iii) ඉගෙනුම් දුබලතා සහිත සිසුන් සඳහා පන්ති කාමරය තුළ ක්‍රියාත්මක කළ හැකි හොඳම භාවිතයන් පහක් (05) පරීක්ෂා කරන්න. (ලකුණු 12)

හිමිකම් ඇවිරිණි.